## මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන

   1.1. දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
   යොමු අංකය : සීපීසී/සීඑස්/12/ආ/14 දිනය: 2017.02.27

   1.2. අමාත්‍යාංශය : මධ්‍යම පළාත් අධ්‍යාපන, පළාත් පාලන ඉඩම් හා සංස්කෘතික අමාත්‍යාංශය
   යොමු අංකය : සීපීසී/සීඑම්එස්/1/4/62 දිනය: 2017.03.08

   1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:
   යොමු අංකය : ඩීඑම්එස්/ඩී/පොදු/11-2 දිනය : 2012.12.19

   1.4. ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය
   යොමු අංකය : සීපීසී/සීඑස්/2/3/එස්එම්/සී(vi) දිනය : 2017.03.28

   1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
   යොමු අංකය: NSCC/10/71/2/SR දිනය: 2018.10.22

2. පත්කිරීම් බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

3. පරිපාටිය ක්‍රියාත්මක දිනය: මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

4. සේවා ගණය පිළිබඳ විස්තර :

   4.1. සේවා ගණය : කළමනාකරණ සහකාර - අධි
   4.2. ශ්‍රේණිය : සංස්කෘතික නිලධාරි (විශේෂ)

   4.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : මධ්‍යම පළාතේ සංස්කෘතික උරුමයන් හා සකලවිධ කලාවන් සුරක්ෂිත කිරීමත්, සාහිත්‍ය, නර්තන, ලේඛන, චිත්‍ර කැටයම්, මූර්ති, ගොක් කලාව හා හස්ත කර්මාන්ත ආදී වූ කලාවන්හි නිර්මාණකරණයේ යෙදෙන්නාවූ පිරිසට ඒ සඳහා අනුබල සැපයීමත්, පොදු ජනතාවගේ ආධ්‍යාත්මික යහගුණයන් ප්‍රවර්ධනය කිරීමත් යන අරමුණු වෙත එළඹීම පිණිස රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් උපාය මාර්ග සැලසීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, නායකත්වය හා මාර්ගෝපදේශකත්වය සැපයීම පොදු කාර්යභාරය වේ.

   4.4. කාර්යයන් පැවරීම : මධ්‍යම පළාතේ සංස්කෘතික අධ්‍යක්ෂ

5. තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

6. වැටුප්

   6.1. වැටුප් කේත අංකය : MN 7-2016
   6.2. වැටුප් පරිමාණය : රු. 41,580 - 11x755 - 18 x1030 - 68,425
   6.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | 05 | 44,600 |

   6.4. වැටුප් ගෙවීම් හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018-12-31 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් 01.2019

7. සේවා ගණයට අයත් තනතුරු :

7.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| සංස්කෘතික නිලධාරි (විශේෂ) | 03 | ඉහත 4.3 හි කාර්යයන් ඉටු කිරීම |

7.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 03 කි.

8. බඳවා ගැනීමේ ක්‍රමය :

8.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

8.2. විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

8.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

8.4. කුසලතා මත බඳවා ගැනීම :

8.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

8.4.2. සුදුසුකම් :

8.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

8.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

8.4.2.3. පළපුරුද්ද :

8.4.2.3.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MN – 5 2016 වැටුප් කේතය යටතේ වැටුප් ලබන සංස්කෘතික නිලධාරි තනතුරක වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

8.4.2.3.2. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

හෝ

8.4.2.3.3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MN – 4 2016 වැටුප් කේතය යටතේ වැටුප් ලබන සංස්කෘතික නිලධාරි තනතුරක වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018-12-31 දින අනුමත කරන ලදී. 04.01.2019 ආණ්ඩුකාර ලේකම්

8.4.2.3.4. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

8.4.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

8.4.2.5. වෙනත් :

8.4.2.5.1. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට 8.4.2 මඟින් දක්වා ඇති සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8.4.2.5.2. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

8.4.2.5.3. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව සුදුසුකම් ලබන දිනට පෙරාතුව වූ වසර පහ (05)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

8.4.2.5.4. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබිය යුතුය.

8.4.3. වයස

8.4.3.1. අවම සීමාව : අදාළ නොවේ.

8.4.3.2. උපරිම සීමාව : අදාළ නොවේ.

8.4.4. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුස්සන් තෝරා ගනු ලැබේ. ලිඛිත විභාගයේදී එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් ලකුණු ලබා ගත් අයැදුම්කරුවන් අතුරින් සියලුම විෂයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයැදුම්කරුවන් අතුරින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේදී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අයැදුම්කරුවන්ගේ ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

8.4.4.1.ලිඛිත විභාගය : ඇමුණුම 01 මගින් විෂය නිර්දේශය දක්වා ඇත.

| විෂය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාවය | පැය 01යි | 100 | 50% |
| 2. කළමනාකරණය | පැය 01, ½ | 100 | 50% |
| 3. පොදු පරීක්ෂණය | පැය 01, ½ | 100 | 50% |

8.4.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

8.4.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.)

8.4.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබාදීමේ ක්‍රමවේදය ඇමුණුම - 02 මගින් දක්වා ඇත.

8.4.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

8.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාතේ සංස්කෘතික දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර නිවේදනයක් මඟින්

9. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

10. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

11. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

12. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018-12-31 දින
අනුමත කරන ලදී.
04.01.2019
ආණ්ඩුකාර ලේකම්

13. අර්ථ නිරූපණ හා නිර්වචන :

13.1. "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

13.2. " ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

13.3. "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයා වේ.

13.4. "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.5. "අධ්‍යක්ෂ" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

13.6. " සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරී ඉටු කිරීම මඟින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මඟින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

13.7. "සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙක් සියලුම වැටුප් රහිත කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. අන්තර්කාලීන විධිවිධාන:

14.1. මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට එක් වරක් පමණක් අදාළ වන පරිදි ක්‍රියාත්මක වේ.

14.2. මධ්‍යම පළාතේ සංස්කෘතික නිලධාරි තනතුරේ වසර 15 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩ හා සක්‍රීය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි MN 5 වැටුප හිමිකරගෙන සිටින I ශ්‍රේණියේ සංස්කෘතික නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කරන අවස්ථාවකදී ඒ වෙනුවෙන් පවත්වනු ලබන ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පුරප්පාඩු සඳහා 2013.01.01 දින සිට පත් කෙරේ. ලිඛිත විභාගය ඇමුණුම 01 සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඇමුණුම 02 මගින් දක්වා ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018-12-31 දින
අනුමත කරන ලදී.
04.01.2019
ආණ්ඩුකාර ලේකම්

14.3. මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට නිලධාරීන් පත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත.

14.4. කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය/ මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැනනගින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | .................................. |
| 02. ජී.ජී.එස්.ජ්. දිසානායක මහත්මිය | (සාමාජික) | .................................. |
| 03. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | .................................. |

දිනය:-2018.11..19..

ආණ්ඩුකාර ලේකම්,

2018.11. 19.... දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ...18/1486.......යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

එල්.ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා
කොමිෂන් සභාව

දිනය : ....14/12/2018....

එල්. ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

..................................

දිනය:-..............................

අනුමත කරමි / ~~නොකරමි~~

..................................
පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 18/12/31............

ඇමුණුම 01

සංස්කෘතික නිලධාරි I ශ්‍රේණියේ සිට සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය.

1. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාවය | පැය 01යි | 100 | 50% |
| 2. කළමනාකරණය | පැය 01, ½ | 100 | 50% |
| 3. පොදු පරීක්ෂණය | පැය 01, ½ | 100 | 50% |

4. විභාගය පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
5. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි පුරප්පාඩු ඇතිවන අවස්ථාවන්හිදී
6. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. අභියෝග්‍යතාවය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා වන දැනුම, කුසලතා, හා ආකල්ප අත්පත් කරගෙන තිබේද? යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද? යන්න මැන බැලීමේ අභියෝග්‍යතා පරීක්ෂණයකි.<br><br>අපේක්ෂකයින්ගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව, සංඛ්‍යානමය හැකියාව, තර්කන හැකියාව, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| 2.කළමනාකරණය | කළමනාකරණය හා සංවිධාන ක්‍රම/ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය |
| 3.පොදු පරීක්ෂණය | සංස්කෘතික කටයුතු විෂය පථයට අවධානය යොමු කරමින් කාලීන, සමාජයීය සිදුවීම් පිළිබඳව අවබෝධ කරගෙන විග්‍රහ කර ගැනීමේ හැකියාව මැන බැලීමේ හා ආයතනයේ ඵලදායිතාවය ඉහළ නැංවීම උදෙසා ඵලදායිතා සංකල්ප, මෙවලම් හා ක්‍රමවේදයන් යොදා ගැනීම පිළිබඳ අවබෝධය මැන බැලීමේ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018-12-31 දින
අනුමත කරන ලදී.
04.01.2019
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 02

සංස්කෘතික නිලධාරි I ශ්‍රේණියේ සිට සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය.

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ජ්‍යෝෂ්ඨතාවය<br>මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංස්කෘතික නිලධාරියෙකු වශයෙන් වසර 05ක සේවා කාලයක් ඉක්මවූ පසු සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 50 | 50 | අදාළ නොවේ |
| 2. කුසලතාවය<br>පූර්වාසන්න වසර 05 සඳහා අදාළ වූ කාර්ය සාධන ඇගයීම් වාර්තා<br>විශිෂ්ඨ බව /ඉතා හොඳයි - එක් වසරකට ලකුණු 3 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/හොඳයි - එක් වසරකට ලකුණු 2 බැගින්<br>සතුටුදායක - එක් වසරකට ලකුණු 1 බැගින් | 15 | |
| 3. සේවා ගණයේ සේවා කාලය තුළ සේවා ඇගයීම් සඳහා පොදු 230 බී ආකෘතිය පරිදි ලබා දෙන ප්‍රශංසා සහතික සඳහා ලකුණු 1 බැගින් | 05 | |
| 4. වෘත්තීය /ක්ෂේත්‍රයට අදාළ වන පාඨමාලා හදාරා තිබීම.(සංස්කෘතික නිලධාරි තනතුරට බඳවා ගැනීමේදී සලකා බලන ලද අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ)<br><br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා ලකුණු 04 බැගින්<br><br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා (අවමය වසර 01 ක) ලකුණු 03 බැගින්<br><br>III. සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>මාස 06ට වැඩි ලකුණු 02<br>මාස 01 ත් 06 ත් අතර ලකුණු 01 | 10 | |
| 5. ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති හා වෘත්තීය මට්ටමෙන් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩසටහන් (ආයතන ප්‍රධානි විසින් අනුමත කරන ලද) | 10 | |
| 6. භාෂා ප්‍රවීණතාව<br>පිළිගත් ආයතනයක හදාරන ලද අනෙක් රාජ්‍ය භාෂාවේ (සිංහල මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද නිලධාරීන් දෙමළ භාෂාවද දෙමළ මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද නිලධාරීන් සිංහල භාෂාවද ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද නිලධාරීන් සිංහල හෝ දෙමළ යන කුමන භාෂාවකින්ද වශයෙනි) සහ සන්ධාන භාෂාවේ,<br><br>ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 03<br>සහතික පත්‍ර පාඨමාලා සඳහා ලකුණු 02 | 05 | |
| 7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා සඳහා | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018-12-31 දින අනුමත කරන ලදී.
04.01.2019
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය - සංශෝධනය - 01

| ඡේද අංකය | දැනට තිබෙන පිළිවෙල | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනය කිරීමට හේතුව |
|---|---|---|---|---|
| 14.2 | මධ්‍යම පළාතේ සංස්කෘතික නිලධාරි තනතුරේ වසර 15 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩ හා සක්‍රිය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි MN - 5 වැටුප හිමිකරගෙන සිටින I ශ්‍රේණියේ සංස්කෘතික නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කරන අවස්ථාවකදී ඒ වෙනුවෙන් පවත්වනු ලබන ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පුරප්පාඩු සඳහා 2013.01.01 දින සිට පත් කෙරේ. ලිඛිත විභාගය ඇමුණුම 01 සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඇමුණුම 02 මගින් දක්වා ඇත. | 14.2 | මධ්‍යම පළාතේ සංස්කෘතික නිලධාරි තනතුරේ වසර 15 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩ හා සක්‍රිය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි MN 5 වැටුප් හිමිකරගෙන සිටින I ශ්‍රේණියේ සංස්කෘතික නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2015.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කරන අවස්ථාවකදී ඒ වෙනුවෙන් පවත්වනු ලබන ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පුරප්පාඩු සඳහා 2015.12.31 දින සිට පත් කෙරේ. ලිඛිත විභාගය ඇමුණුම 01 සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඇමුණුම 02 මගින් දක්වා ඇත. | සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය සංශෝධනය කිරීම තුළින් වැඩි නිලධාරීන් පිරිසකට අයැදුම් කිරීමට අවස්ථාව සලසා දීම සඳහා |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.08.08 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ටී.බී.එච්. දුනුවිල මහතා | (සභාපති) | ........................ |
| 02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 03. ඒ.එම්. වයිස් මහතා | (සාමාජික) | ........................ |
| 04. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 05. එන්.ඩී.කේ. පියුම්සිරි මහතා | (සාමාජික) | ........................ |
| 06. ජී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 07. කේ. රාජසුන්දරම් මහතා | (සාමාජික) | ........................ |

දිනය 2019-07-23

ආණ්ඩුකාර ලේකම්,

2019-07-23 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 19/935 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි සංශෝධනය - 01 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2019.07.31

.................................

ලේකම්

මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා

කොමිෂන් සභාව.

නිල මුද්‍රාව

එම්.ජී.ඒ. තිලකරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි / ~~නොකරමි~~

රංජිත් කීර්ති තෙන්නකෝන්
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත.
2019/08/08

.......................................................

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය.

දිනය:..............................